සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**Second Term Test - 2025**

43 S I

**6 ශ්‍රේණිය**

# චිත්‍ර කලාව - I

**කාලය පැය 02 යි**

නම/ විභාග අංකය:


සැලකිය යුතුයි.

- මෙම ප්‍රශ්න පත්‍රය ලිඛිත සහ ප්‍රායෝගික වශයෙන් කොටස් දෙකකින් සමන්විත ය. කොටස් දෙකට ම පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.

---

## I කොටස

- ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- පහත දක්වා ඇති රූප සටහන ඇසුරින් අංක 01 - 05 තෙක් ප්‍රශ්නවලට හිස් තැනට සුදුසු වචන යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.




01. ඉහත රූපයෙන් දැක්වෙන්නේ ........................................................................ ගෙඩිගෙඩිගෙ ගොඩනැගිල්ලක බිම් සැලැස්මයි.

02. මෙහි "A" අක්ෂරයෙන් දැක්වන්නේ එහි ප්‍රධානතම අංගය වන ........................................................................ යි.

03. මෙම රූප සටහනේ "B" අක්ෂරයෙන් දැක්වෙන කොටස ........................................................................ නමින් ද හැඳින්වේ.

04. මෙහි "C" අක්ෂරයෙන් දැක්වෙන්නේ ........................................................................ නමින් හඳුන්වන කොටස යි.

05. "D" අක්ෂරයෙන් දැක්වෙන ''ගර්භ ගෘහය'' නම් මෙම කොටස කුඩා ........................................................................ දේවාලයක හැඩය ගත් ආකෘතිමය කලා කෘතියකි.

- ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා නිවැරදි පිළිතුර සහිත වරණයට යටින් ඉරක් අඳින්න.

06. මූලික වර්ණ 02ක් එක් කළ විට සෑදෙන්නේ,

(1) ප්‍රධාන වර්ණ වේ. (2) ද්විතීයික වර්ණ වේ. (3) තෘතීය වර්ණ වේ. (4) විසංසත වර්ණ වේ.

07. ළමා පොත් පිටකවරයක් නිර්මාණය කිරීම සඳහා භාවිත කරනු ලබන මුද්‍රණ ක්‍රමය අයත් වන්නේ,

(1) ග්‍රැෆික් සැලසුම් ක්‍රමයටය. (2) ටෙම්ප්ලේට් ක්‍රමයටය.

(3) මෝස්තර නිර්මාණ ක්‍රමයටය. (4) එකලස් කිරීමේ ක්‍රමයටය.

08. ඉවතලන ප්ලාස්ටික්, තහඩු, ලී, ලැලි පටි, ගම්වර්ග, කඩදාසි, කාඩ්බෝඩ් පැනසල් සායම් පින්සල් ආදී විවිධ ද්‍රව්‍ය යොදා ගනිමින් මූර්ති නිර්මාණය කිරීම.

(1) ඇඹීමේ ක්‍රමය වේ. (2) නෙලීමේ ක්‍රමය වේ.

(3) එකලස් කිරීමේ ක්‍රමය වේ. (4) ග්‍රැෆික් ක්‍රමය වේ.

09. ඔබ පන්ති කාමරයේ දී ගෝලාකාර වස්තුන් ඇඳ ත්‍රිමණ ලක්ෂණ දැක්වීම සඳහා භාවිත කරනු ලබන පැන්සල් වර්ගය වන්නේ,

(1) 'H' අගයෙන් වැඩි පැන්සල්ය. (2) 'H' අගයෙන් අඩු පැන්සල්ය.

(3) 'HB' අගයේ පැන්සල්ය. (4) 'B' අගයෙන් වැඩි පැන්සල්ය.

10. පන්ති කාමරයේ දී විවිධ වර්ණ සහිත කොළ ඉරා ඇලවීමෙන් නිර්මාණය කරනු ලබන චිත්‍ර හඳුන්වන්නේ,

(1) කොලාජ් චිත්‍ර ලෙසයි. (2) ග්‍රැෆික් චිත්‍ර ලෙසයි.

(3) මෝස්තර චිත්‍ර ලෙසයි. (4) ප්‍රකාශන චිත්‍ර ලෙසයි.


- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල රූපයට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

(මස්ජිදය / උපරිව්‍යුහය / සන්ධාකාර / සඨාකාර / ඉන්දියාවේ සාංචි ස්තූපය / කැලිග්‍රැෆි)


11 ........................................................




12 ........................................................




13 ........................................................




14 ........................................................



15 ........................................................



- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ඇති වාක්‍ය හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (×) ලකුණ ද වාක්‍ය ඉදිරියේ ඇති හිස්තැනෙහි ලකුණු කරන්න.**

16. වෙසක් උත්සවයේ දී ගම්බද ප්‍රදේශවල පහන් සඳහා විකල්ප ක්‍රම වශයෙන් වෙල් කදුරු ගෙඩි සහ නාවා ගස්වල ගෙඩි භාවිත කරයි. (...........)

17. තෛපොංගල් උත්සවය දමිළ අවුරුදු ක්‍රමය අනුව වසරේ පළමු මාසය වන ''තෛ'' මාසයේ 14 දින හෝ 15 දින පැවැත් වේ. (...........)

18. රාමසාන් උත්සවය දිනයේ කෙරෙන මහත් සත්ක්‍රියාවක් වන්නේ 'සදකා' නම් දානය දීමයි. (...........)

19. හින්දු ආගමික සංකේතය ලෙස වෘෂභ කොඩිය භාවිත කරයි. (...........)

20. අරාබියේ සිට ශ්‍රී ලංකාවට මුස්ලිම්වරු පැමිණීමේ ප්‍රතිඵලයක් ලෙස රෝමන් ක්‍රමයේ දේවස්ථාන ලංකාව තුළ ඇති විය. (...........)

(ල. 20 × 2 = 40)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

43 S I

6 ශ්‍රේණිය

# චිත්‍ර කලාව - II, III

නම/ විභාග අංකය:

## චිත්‍ර කලාව - II

01. ඔබ පන්ති කාමරයේ දී අඳින ලද පහත ද්‍රව්‍ය 02ක් ඇඳ පැන්සල භාවිතයෙන් වර්ණ කරන්න.
(බෝලය, ගස්ලබු, ගෙඩිය, ඝනකය, ඝනකාභය) (ලකුණු 20)

## චිත්‍ර කලාව - III

01. පහත දී ඇති මාතෘකා අතරින් එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන වර්ණවත් චිත්‍රයක් අඳින්න.
    (1) ආගමික පුද බිමක වන්දනාවේ යෙදන බැතිමතුන් ඇඳ වර්ණ කරන්න.
    (2) ඇළ දොළ සහ සත්තු සහිත වනාන්තරයක් ඇඳ වර්ණ කරන්න.
    (3) මල් කොළ ඇසුරෙන් චීත්ත රෙද්දකට සුදුසු මෝස්තරයක් ඇඳ වර්ණ කරන්න.
    (4) ටෙම්ප්ලේට් ක්‍රමයට තැගි දවටනයකට සුදුසු මෝස්තරයක් නිර්මාණය කරන්න.
    (5) ජ්‍යාමිතික හැඩතල ඇසුරෙන් ව්‍යාප්ත මෝස්තරයක් අඳින්න.
    (6) ළමා කතන්දර පොතකට සුදුසු පිටකවරයක් ඇඳ වර්ණ කරන්න.

(ලකුණු 40)

**පිළිතුරු පත්‍රය - I කොටස**

01. හින්දු ආගමික 02. ගෝපුරම් / ගෝපුර 03. මණ්ඩපය 04. ප්‍රදක්ෂිණා පථය 05. හින්දු
06. ii 07. i 08. iii 09. iv 10. i 11. ඉන්දියාවේ සාංචි ස්ථූපය
12. කැලිග්‍රැෆි 13. මස්ජිදය 14. සණ්ඨාකාර 15. උපරිව්‍යුහය 16. ✓ 17. ✓
18. ✗ 19. ✓ 20. ✗ (ලකුණු 2 × 20 = 40)

## II - කොටස

01. ගති ලක්ෂණ හා ත්‍රිමාණ ලක්ෂණ පෙන්වා පැන්සලෙන් වර්ණ කර ඇත්නම් ලකුණු දෙන්න. (ල. 20)

## III - කොටස

- ලකුණු දීමේ නිර්ණායක

<u>ප්‍රකාශන චිත්‍ර</u>

(1) තෝරාගත් මාතෘකාව ප්‍රකාශ කිරීමේ දී ඊට උචිත වාතාවරණය ප්‍රකාශ කර ඇති අයුරුව.
(2) මානව රූප හා සත්ව රූ ඇතුළු සියලු හැඩතල තලය මත සම්පිණ්ඩනය කර ඇති අයුරු.
(3) සිද්ධාන්ත භාවිතය (ත්‍රිමාණ ලක්ෂණ, පර්යාවලෝකය, පරිමානය)
(4) වර්ණ භාවිතයේ දක්වා ඇති කුසලතාව.
(5) අනුගමනය කර ඇති ශෛලිය සහ සමස්ත නිමාව.

(ල. 5 × 8 = 40)

<u>මොස්තර චිත්‍ර</u>

(1) මතෘකාවට අදාළව නවතාවයකින් යුතුව සැලසුම් කිරීම.
(2) පරිභාරික අවශ්‍යතාවයන්ට ගැළපෙන බව හා කර්මාන්තයට උචිත බව.
(3) රේඛා හැඩතල අර්ථවත්ව යොදා ගැනීමේ හැකියාව.
(4) උචිත වර්ණ තෝරාගැනීමේ හා භාවිතයේ හැකියාව.
(5) විචිත්‍රත්වය, චමත්කාරය හා නිර්මාණයේ සාර්ථකත්වය.

(ල. 5 × 8 = 40)

<u>ග්‍රැෆික් චිත්‍ර</u>

(1) මාතෘකාවට උචිත ලෙස නවතාවයකින් සැලසුම් කිරීමේ හැකියාව
(2) වානිජමය අවශ්‍යතාවයන්ට හා මුද්‍රණයට උචිත බව.
(3) රේඛා හැඩතල අර්ථවත්ව යොදාගැනීමේ හැකියාව.
(4) උචිත වර්ණ තෝරාගැනීමේ හා භාවිත කිරීමේ හැකියාව.
(5) විචිත්‍රත්වය, චමත්කාර හා නිර්මාණයේ සාර්ථකත්වය.

(ල. 5 × 8 = 40)